# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2356/20 - 2023 නොවැම්බර් මස 01 වැනි බදාදා - 2023.11.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, මෙහි උපලේඛනයේ (I) වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන්, එම උපලේඛනයේ (II) වැනි තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, 2023 නොවැම්බර් මස 02 වැනි දින සිට ආරම්භ වන වසරක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, මෙම නියමය මගින් පනවමි.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ පනවන ලද 2023 ජනවාරි මස 04 දිනැති අංක 2313/34 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් සීනි (රේගු ශීර්ෂ අංක 17.01) සඳහා ප්‍රකාශිත නියමය 2023 නොවැම්බර් මස 02 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2023 නොවැම්බර් මස 01 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

1A - PG 6515 — 431 (2023/11)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

| (I) වැනි තීරය | | | | (II) වැනි තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | |
| 01 | 17.01 | | ඝන තත්ත්වයේ ඇති උක් හෝ බීට් සීනි සහ රසායනිකව පවිත්‍ර සුක්‍රෝස් | |
| | | | අනෙකුත්: | |
| | | 1701.91 | එකතු කරන ලද රසකාරක හෝ වර්ණක අඩංගු: | |
| | | 1701.91.10 | පොලරිමීටරයේ 99.7˚ ට වැඩි හෝ සමාන සංඛ්‍යාත සහිත | කි. ග්‍රෑමයට රු. 50 |
| | | 1701.91.20 | පොලරිමීටරයේ 99.5˚ ට වැඩි හෝ සමාන සහ 99.7˚ ට අඩු සංඛ්‍යාත සහිත | කි. ග්‍රෑමයට රු. 50 |
| | | 1701.99 | අනෙකුත්: | |
| | | 1701.99.10 | පොලරිමීටරයේ 99.7˚ ට වැඩි හෝ සමාන සංඛ්‍යාත සහිත උක් සීනි | කි. ග්‍රෑමයට රු. 50 |
| | | 1701.99.20 | පොලරිමීටරයේ 99.5˚ ට වැඩි හෝ සමාන සහ 99.7˚ ට අඩු සංඛ්‍යාත සහිත උක් සීනි | කි. ග්‍රෑමයට රු. 50 |
| | | 1701.99.30 | පොලරිමීටරයේ 99.7˚ ට වැඩි හෝ සමාන සංඛ්‍යාත සහිත බීට් සීනි | කි. ග්‍රෑමයට රු. 50 |
| | | 1701.99.40 | පොලරිමීටරයේ 99.5˚ ට වැඩි හෝ සමාන සහ 99.7˚ ට අඩු සංඛ්‍යාත සහිත බීට් සීනි | කි. ග්‍රෑමයට රු. 50 |
| | | 1701.99.90 | අනෙකුත්: | කි. ග්‍රෑමයට රු. 50 |

EOG 11 - 0025

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.